| | | |
|---|---|---|
| 43 | S | I |

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## පෙරහුරු පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023
## චිත්‍ර කලාව - I

නම විභාග අංකය : ........................................................................................................ කාලය : පැය 1

- **පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.**



1. මෙම වාස්තු විද්‍යා නිර්මාණය ............................................. යුගයේ නිමවූවක්.

2. ක්‍රි.ව 10 සියවසේ ඉදිකරන ලද මෙම නිර්මාණය ............................................ නමින් හැඳින්වේ.

3. ශිලා ලේඛනයක සඳහන්ව ඇති ආකාරයට සොලී රාජ්‍යයේ අගරජ වූ මහා රාජාරාජගේ අගමෙහෙසිය වූ ............................................. සිහිවීම පිණිස ඉදි කර ඇත.

4. දකුණු ඉන්දීය චෝල ගෘහ නිර්මාණ ලක්ෂණ හොඳින් නිරූපණය වන මෙහි මණ්ඩපය, අන්තරාලය, සහ .............................. යන කොටස් තුනකින් සමන්විත වේ.

5. පුරා විද්‍යා කැනීම් වලදී සොයාගන්නා ලද හින්දු ප්‍රතිමා අතර .................................. මූර්තිය සහ පාර්වතී දෙවඟන ඇතුළු මූර්ති සමූහයක් හමුවී ඇත.

- **අංක 6 සිට 11 තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

6. පුරාවිද්‍යා කොමසාරිස්වරයෙකු වූ සෙනරත් පරණවිතාන මහතාගේ මතයට අනුව ඉසුරුමුණි විහාරයේ දක්නට ලැබෙන මිනිසා සහ අශ්වහිස කැටයමෙන් නිරූපණය වන අදහස කුමක් ද? ...........................................................................................

7. 1980 දශකය තුළ තෙල්සායම් මාධ්‍යයෙන් කැන්වසයක් මත ජ්‍යාමිතික හැඩතල ඇසුරින් නිර්මාණ කරන ලද ''සඳපායා'' නැමැති සිතුවමේ නිර්මාණ ශිල්පියා නම් කරන්න.

.....................................................................................................

8. ග්‍රීක මූර්ති නිර්මාණ අතර කාන්තාවගේ සුන්දරත්වය මෙන්ම නාරිදේහ ලාලිත්වය මනාව පෙන්නුම් කරණ කිරිගරුඬ මාධ්‍යයෙන් නිමකර ඇති 1820 දි මේලෝ දිවයිනෙන් සොයා ගන්නා ලද මූර්තිය කුමක් ද? ..............................................................

9. ලියනාඩෝ ඩාවින්චි ශිල්පියා විසින් ඉතාලියේ මිලාන් හි ශාන්ත මරියා ඩෙලාග්‍රෙසී තාපසාරාමයේ බිත්තියෙහි අඳින ලද සිතුවම කුමක් ද? ..............................................................

10. විශාල ප්‍රමාණයේ චෛත්‍ය සඳහා එහි සතර දිශාවෙන් ඊට සම්බන්ධකොට නිමවා ඇති වාස්තු විද්‍යා නිර්මාණය කුමන නමකින් හඳුන්වන්නේ ද? ..............................................................

- **අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

11. ප්‍රෙස්කෝ බුවනෝ යනු,
    1. බදාම ආලේප කොට වියළුණු පසුව ඇඳීමයි
    2. බදාම ආලේප කොට ඒ මත මකුළු මැටි ආලේප කොට ඇඳීමයි
    3. තෙත බදාම මත ඇඳීමයි
    4. හුණු මිශ්‍රිත බදාම මත ඇඳීමයි

12. මහනුවර දළාදා මාලිගයේ පත්තිරිප්පුව නමින් හඳුන්වන වාස්තු විද්‍යා අංගය නිර්මාණය කරන ලද ශිල්පියා වන්නේ,
    1. දෙවරගම්පොල සිල්වත්තැන ශිල්පියාය
    2. දෙල්මඩ මූලාචාර්‍ය ශිල්පියාය
    3. ගනේශ්වරාචාරී ශිල්පියාය
    4. දේවේන්ද්‍ර මූලාචාරී ශිල්පියාය


13. අගස්ති හා විනයාගර් සහ ඇතා වල්ලිව එලවාගෙන යාම යනාදී සිතුවම් නිර්මාණය කරන ලද ශිල්පියා වන්නේ,
    1. කේ කනක සබාපති ශිල්පියාය.
    2. තා වඩිමූ තුරෙයි සාමි ශිල්පියාය
    3. පෙරිය තම්බි සුබ්‍රමණියම් ශිල්පියාය.
    4. සිරිත්තිරන් සුන්දර් ශිල්පියාය.

14. පිත්තල කර්මාන්තයේ දී භාවිතා කරන ලද ක්‍රම වේදයක් ලෙස
    1. ගන කැපීම හැඳින්විය හැක
    2. පට්ටල් වැඩ හැඳින්විය හැක
    3. වාත්තු වැඩ හැඳින්විය හැක
    4. අල්ලියාදු ගෑම හැඳින්විය හැක


15. පොළොන්නරු යුගයට අයත් හොඳම සිතුවම් දක්නට ලැබෙන ස්ථානය වන්නේ,
    1. පොත්ගුල් විහාරය
    2. පරාක්‍රම මාලිගයයි
    3. විද්‍යාධාර ගුහාවයි
    4. තිවංක පිළිම ගෙයයි

- **අංක 16 සිට 25 තෙක් දී ඇති රූප සටහන් වලට කිසියම් සම්බන්ධයක් දක්වන රූපසටහන ඉදිරියේ ඇති A , B , C , D , E යන ඒවා අතුරින් තෝරා එහි අක්‍ෂරය තිත් ඉර මත ලියන්න.**

21.  (..........)  A

22.  (..........)  B

23.  (..........)  C

24  (..........)  D

25.  (..........)  E

- **අංක 26 සිට 30 දක්වා දී ඇති එක් එක් වාක්‍යයන්හි හිස්තැනට සුදුසු වචනය/වචන යොදා සම්පූර්ණ කරන්න.**

26. සුවිශේෂී සමාජ ප්‍රකාශනයක් නිරූපනය කරමින් තුවක්කුවක් අතින් ගත් මාරයෙකු දැක්වෙන මාර පරාජය සිතුවම ............................................ විහාරයේ වියන් තලයෙහි ඇඳ ඇත.


27. සීගිරි සිතුවම් අතර දක්නට ලැබෙන රන්වන් පැහැති හා නිල්වන් පැහැති කාන්තා රූප යුගලය පිළිබඳව සෙනරත් පරණවිතාන මහතා පවසනුයේ ....................................... බවයි.

28. විජයොත්පාය නමින් හැඳින්වෙන ගෘහ නිර්මාණ අංගය දක්නට ලැබෙන විහාරය ................................................ යන නමින් හැඳින්වේ.

29. ශක්තිය, නිර්භීත භාවය, මානව දයාව කරුණාව යන ගුණාංග නිරූපනය වන ..................................................... නැමැති මූර්තිය මයිකල් ඇන්ජිලෝ ශිල්පියා විසින් නිමකර ඇත.

30. ජාතික කලා භවනෙ නිත්‍ය ප්‍රදර්ශනයට තබා ඇති ..................................................... නැමැති සිතුවම ඩේවිඩ් පේන්ට ශිල්පියා විසින් කැන්වසයක් මත තෙල් සායමෙන් නිමකරන ලද සිතුවමකි.

- **අංක 31 සිට 35 තෙක් දී ඇති ප්‍රශ්නවලට A, B, C, D, E යන රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**


A


B


C


D


E

31. A අක්ෂරයෙන් දැක්වෙන මෙම අනුරාධපුර යුගයට අයත් බුද්ධ ප්‍රතිමාව හඳුන්වන නම කුමක්ද?

.............................................................................................................................................

32. B අක්ෂරයෙන් දැක්වෙන ස්වභාවික හා තාත්වික හැඩ දැක්වීම වෙනුවට නිරූපණාත්මක හා වියුක්ත හැඩතල භාවිතා කළ මෙම මූර්තිය නිර්මාණය කළ ශිල්පියා නම්කරන්න.

.............................................................................................................................................

33. C අක්ෂරයෙන් දැක්වෙන ලුම්බිණි සල් උයනේදී සිදු වූ සිදුහත් කුමරුන්ගේ උප්පත්තිය නිරූපණය කරන මෙම සිතුවම දක්නට ලැබෙන විහාරස්ථානය නම් කරන්න.

.............................................................................................................................................

34. D අක්ෂරයෙන් දැක්වෙන මෙම කාටූන් චරිතය නිර්මාණය කරන ලද ශිල්පියා කවුද ?

.............................................................................................................................................

35. E අක්ෂරයෙන් දැක්වෙන මෙම වාස්තු විද්‍යාත්මක නිර්මාණය හඳුන්වන නම කුමක් ද?

.............................................................................................................................................

- **ඔබ වෙත සපයා ඇති වර්ණ චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක 36 සිට 40 තෙක් දී ඇති උපමාතෘකා වලට අදාලව.**



36. ස්ථානය : .............................................................................................................

.............................................................................................................................................

37. ශිල්පියා : .............................................................................................................

.............................................................................................................................................

38. තේමාව : .............................................................................................................

.............................................................................................................................................

39. සංරචනය : .............................................................................................................

.............................................................................................................................................

40. හැඟීම් ප්‍රකාශය .............................................................................................................

.............................................................................................................................................

| 43 | S | I |
|---|---|---|

## පෙරහුරු පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023
## චිත්‍ර කලාව - II

නම විභාග අංකය : ........................................................................................................ කාලය : පැය 2

### නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට
  1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා සපයා ඇති රළු කඩදාසිය භාවිතා කරන්න.
  2. ඔබට පෙනෙන ආකාරයට ද්‍රව්‍ය සමූහය ඇඳ වර්ණ කරන්න. ඒ සඳහා ලබාදී ඇති විශේෂ කඩදාසිය භාවිතා කරන්න.
- මෙම චිත්‍ර දෙකම එකට අමුණා විභාග ශාලාධිපතිට භාරදෙන්න.
- ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සළකන්න.

  - **රේඛා අධ්‍යයනය**

    1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතාවය
  - **වර්ණ චිත්‍රය**

    2. ද්‍රව්‍ය සමූහය තලයමත කලාත්මකව සම්පිණ්ඩනය වීම.
    3. පරිමානය, පර්යාවලෝකන රීති හා ත්‍රිමාණ ලක්‍ෂණ පිළිබඳව අවබෝධය
    4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගති ලක්‍ෂණ දැක්වීම.
    5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා
    6. උචිත පසුබිමක් යෙදීම හා සමස්ථ නිමාව

සැලකිය යුතුයි :-

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල ද්‍රව්‍ය සමූහයට ගැළපෙන ආකාරයට වෙනස් කිරීමට ඔබට අවසරය ඇත.

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

| 43 | S | I |
|---|---|---|

## පෙරහුරු පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023
## චිත්‍ර කලාව - III

නම විභාග අංකය : ........................................................................................................ කාලය : පැය 2

- **එක් චිත්‍රයක් පමණක් ඇඳිය යුතුවේ.**
- **ඕනෑම මාධ්‍යයක් භාවිතා කළ හැක. (අතේ නොගෑවෙන මාධ්‍ය භාවිතා කරන්න.)**

''අ'' කොටසින් හෝ ''ආ'' කොටසින් හෝ ''ඉ'' කොටසින් එක් මාතෘකාවක් පමණක් තෝරාගන්න.

### ''අ'' කොටස - චිත්‍ර සංරචනය

01. පූජනීය පෙදෙසක් නැරඹීමට පැමිණි වන්දනා කරුවන් පිරිසක් එළිමහනේ දිවා ආහාරය ගන්නා අවස්ථාවක්.
02. මාළු අස්වැන්න ගොඩට ගෙනෙන ධීවර පිරිසක්
03. දොළක කෙලිදෙලෙන් දියනාන පිරිසක්
04. පදික වෙළඳ සැලක් අසල පළතුරු බුදින විදේශිකයන් පිරිසක්.

### ''ආ'' කොටස - මෝස්තර නිර්මාණය

05. සාම්ප්‍රදායික සැරසිලි ඒකක භාවිතයෙන් පිත්තල බන්දේසියකට සුදුසු මෝස්තරයක් සැලසුම් කර වර්ණ කරන්න.
06. චීත්ත රෙද්දකට මුද්‍රණය කිරීම සඳහා ව්‍යාප්ත වී යන ලෙස අඟල් 9 × 9 ප්‍රමාණයේ මොස්තර කොටසක් මල්, කොළ, ගෙඩි, ඇසුරින් නිර්මාණය කරන්න.
07. සමාන පැති අටකින් යුතු කුඩ රෙද්දක් සඳහා අලංකාර මෝස්තරයක් නිර්මාණය කරන්න.

### ''ඉ'' කොටස - ග්‍රැෆික් චිත්‍ර

08. පාසලේ පැවැත්වෙන සාහිත්‍ය උළෙල සඳහා සුදුසු ආරාධනා පත්‍රයක් නිර්මාණය කරන්න.
09. ''පරිසරයයි සුවදිවියයි'' යන මැයින් පෝස්ටර් චිත්‍රයක් නිර්මාණය කරන්න.
10. ''පුංචි වීරයෝ'' නැමැති ළමා කතන්දර පොතකට පිටකවරයක් සැලසුම් කරන්න.

43 | S | I

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

## පෙරහුරු පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2022 (2023)
## චිත්‍ර කලාව - II (ආදර්ශ ආකෘතිය)

නම විභාග අංකය : ........................................................................................................ කාලය : පැය 2



අවශ්‍ය ද්‍රව්‍ය :-

* සාමාන්‍ය ප්‍රමාණයේ ලෙල්ල ඉවත් කළ පොල් ගෙඩියක් .
* බෝතලයක් (රවුම් හැඩයේ)
* කොටු සහිත රෙදි කැබැල්ලක් .
* සාමාන්‍ය ප්‍රමාණයේ (ගෝල්ඩ් මාරි) හිස් බිස්කට් පෙට්ටියක්
* වර්ණවත් කෝමන් කොළ 5 කින් යුතු කෝමන් අත්තක් .